සැ.යු:- 2024.11.08 දින පළ කරන ලද අංක 2410 ගැසට් පත්‍රයේ IV අ කොටස පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,411 - 2024 නොවැම්බර් මස 14 වැනි බ්‍රහස්පතින්දා - 2024.11.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස : ඉඩම්

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක්

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... ... ... | — |
| අවසාන නියෝග ... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත ... ... ... ... | — |
| මධ්‍යම පළාත ... ... ... ... | — |
| දකුණු පළාත ... ... ... ... | — |
| උතුරු පළාත ... ... ... ... | — |
| නැගෙනහිර පළාත ... ... ... ... | — |
| වයඹ පළාත ... ... ... ... | — |
| උතුරු මැද පළාත ... ... ... ... | — |
| ඌව පළාත ... ... ... ... | — |
| සබරගමුව පළාත ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 422 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම.... ... — | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | 423 |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 දෙසැම්බර් මස 06 වැනි දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 නොවැම්බර් මස 22 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක් නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය, හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

421 - B 82627—553 (2024/11)
C1-

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරුමැද පළාතේ, පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කේ. පී. කේ. එල්. පී. මධුවන්ති වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.05.24 දින ප්‍රදානය කර ඇති අංක අනු/තිර/ප්‍ර/1556 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන ඔරුක්මාන්කුලම පදිංචි තිලකරත්න චන්ද්‍රසේකර මුදියන්සේලාගේ දයාවති වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 176/22 යටතේ 1997.06.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටියද ඔහු/ඇය අනුප්‍රාප්තිකයෙකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උලගල්ල පත්තුවේ/කෝරළේ 529. පෙරිමියන්කුලම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ඔරුක්මාන්කුලම නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, අංක 1277 දරන රේඛා සටහනේ ප්‍රමාණයෙන් අක්කර එකක්, විශාලත්වය ඇත්තාවූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : ගොඩ

| | | |
|---|---|---|
| උතුරට | - | යකල්ල - ගල්කුලම පාර රක්ෂිතය, |
| නැගෙනහිරට | - | තිලකරත්න මුදියන්සේලාගේ සෝමපාලගේ මඩ ඉඩම, |
| දකුණට | - | රජයේ ඉඩම, |
| බස්නාහිරට | - | ඔරුක්මාන්කුලම ගමට යන පාරේ රක්ෂිතය. |

කේ. පී. කේ. එල්. පී. මධුවන්ති,
ප්‍රාදේශීය ලේකම්,
තිරප්පනේ.

2024 අගෝස්තු මස 26 වැනි දින.

11 - 163/1

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරුමැද පළාතේ, පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එන්. බී. එස්. ඒ. නායක බණ්ඩාර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1986.06.12 දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර/11127 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන උක්කුලංකුලම පදිංචි හෙට්ටිනාරායන මුදියන්සේලාගේ සිංඤෝ අප්පුහාමි වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 20/07 යටතේ 1992.09.06 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

### උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 588 - උක්කුලංකුලම (20බී) තුලානේ උක්කුලංකුලම ගමේ පිහිටා ඇත්තාවූද, සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ.ග.පි. 168 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 298 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.403 විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම ගොඩ

| | | |
|---|---|---|
| උතුරට | - | කැබලි අංක 12, |
| නැගෙනහිරට | - | කැබලි අංක 303, |
| දකුණට | - | කැබලි අංක 299, |
| බස්නාහිරට | - | කැබලි අංක 297. |

එන්. බී. එස්. ඒ. නායක බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,
මිහින්තලේ.

2023 පෙබරවාරි මස 10 වැනි දින.

11 - 163/2

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ 4 වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම (104 වගන්තිය) සඳහා වූ නිවේදනයයි

උතුරුමැද පළාතේ, පළාත් සභාවේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් එන්. බී. එස්. ඒ. නායක බණ්ඩාර වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උපවගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් 1986.06.12 දින ප්‍රදානය කර ඇති අංක අනු/ප්‍ර/3748 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන සංගිලිකුලම පදිංචි අප්පුරාල මැණික්රාලගේ ඩිංගිරිබණ්ඩා වෙත ප්‍රදානය කොට අනුරාධපුර දිස්ත්‍රික් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක 30/129 යටතේ 1993.05.25 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියාකරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2024.12.27 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

#### උපලේඛනය

අනුරාධපුර පරිපාලන දිස්ත්‍රික්කයේ, මිහින්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 588 - උක්කුලංකුලම තුලානේ සංගිලිකුලම ගමේ පිහිටා ඇත්තාවූද, සර්වේ ජනරාල්වරයා විසින් සම්පාදිත අංක අ.ග.පි. 158 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි අංක 250 දරන බිම් කැබැල්ල වශයෙන් පෙන්නුම් කොට ඇත්තාවූ ද, ප්‍රමාණයෙන් අක්කර 01 රූඩ් 03 පර්චස් 37 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම් වූ ද රජයේ ඉඩම : ගොඩ

| | | |
|---|---|---|
| උතුරට | - | කැබලි අංක 247, |
| නැගෙනහිරට | - | කැබලි අංක 249, |
| දකුණට | - | කැබලි අංක 252, |
| බස්නාහිරට | - | කැබලි අංක 251. |

එන්. බී. එස්. ඒ. නායක බණ්ඩාර,<br>ප්‍රාදේශීය ලේකම්,<br>ප්‍රාදේශීය මහලේකම් කාර්යාලය,<br>මිහින්තලේ.

2023 ජනවාරි මස 30 වැනි දින.

11 - 163/3

---

## ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම්

### ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය : 4/10/75804.<br>මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය : සීපීසී/එල්සී/එල්ඩී/4/1/30/47

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

මාතලේ දිස්ත්‍රික්කයේ, ලග්ගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කන්දේපිටවල ඊ 402 ග්‍රාම නිලධාරී වසමේ, කන්දේපිටවල ගමේ අ. භූ. පි. 20 හි අතිරේක 109 හි පත්‍ර අංක 183 හි කට්ටි අංක 6757 හි කොටසක් දැක්වීමට ජනපද නිලධාරී විසින් අඳින ලද අනුරේඛනයේ ප්‍රමාණයෙන් රූඩ් 02 ක් වූ රජයේ ඉඩම් කොටස කෝණාර මුදියන්සේලෑ පහුරේ ගෙදර මිල්ටන් සේනාධීර මහතා වෙත කෘෂිකාර්මික කටයුතු සඳහා දීර්ඝ කාලීන බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| *උතුරට* | : | ජගත් වසන්ත කෝනාර මයාගේ ඉඩම (දීර්ඝකාලීන බදු ඉල්ලා ඇති), |
| *නැගෙනහිරට* | : | මාර්ග රක්ෂිතය (1329 1/2), |
| *දකුණට* | : | LL බලපත්‍ර සහිත ඉඩම, |
| *බටහිරට* | : | ඇළ රක්ෂිතය |

3. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට සුදුසුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ.

*(අ.)* *බදු කාලය* : අවුරුදු තිහයි (30) (2024.08.07 දින සිට වසර 30ක් ඉදිරියට),

*(ආ).* *වාර්ෂික බදු මුදල* : 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ (රු. 5,000,000) හෝ මිලියන පහට වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත එම වර්ෂයේ ඉඩමේ නොදියුණු වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : වාර මුදලක් අය නොකෙරේ,

*(ඇ.)* මෙම ඉඩම කෘෂිකාර්මික කටයුතු සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය,

*(ඈ.)* ඉඩමේ භුක්තිය බාර දී අවුරුද්දක් ඇතුළතදී පළාත් ඉඩම් කොමසාරිස්/නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්/

ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය,

*(ඉ.)* පළාත් ඉඩම් කොමසාරිස්/ප්‍රාදේශීය ලේකම් හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය,

*(ඊ.)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

*(උ.)* 2024.08.07 දින සිට වසර 05 ක් ගත වන තුරු මෙම ඉඩම අතුරු බදු හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ. ඉන්පසු වුවද, අතුරු බදු හෝ පැවරීම් කළ හැක්කේ මෙම ඉඩම බදුගත් කාරණය සඳහා පමණි,

*(ඌ.)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත. බදු ගෙවීම අඛණ්ඩව සිදු නොකර ඇති අවස්ථාවකදී ගෙවිය යුතු හිඟ බදු සඳහා 10% ක දඩ පොළියක් අය කරනු ලැබේ.

මෙහි පහත සඳහන් දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

කේ. ජී. පී. සෞම්‍යා,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 ඔක්තෝබර් මස 23 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේදී ය.

11 - 188

---

**ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව**

*ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ අංකය* : 4/10/72078.
*අන්තර් පළාත් ඉඩම් කොමසාරිස්ගේ අංකය* : NWP/PLC/L9/AB/LTL/14

21(2) දරන රජයේ ඉඩම් රෙගුලාසිය යටතේ කෙරෙන නිවේදනයයි

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 190, අඹන්පොල දකුණ ග්‍රාම නිලධාරී වසමේ, ගෝනමඩිත්ත ගමේ අ. ග. පි. 143 හි කැබලි අංක 04 දරන ඉඩමෙන් කොටසක් සඳහා ජනපද නිලධාරී විසින් අඳින ලද අනුරේඛනයේ කැබලි අංක A මගින් දැක්වෙන ප්‍රමාණයෙන් පර්චස් 40 ක් වූ රජයේ ඉඩම් කොටස වාණිජ කටයුතු සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් බදු ඉල්ලා ඇති බව මෙයින් නිවේදනය කෙරේ.

2. ඉල්ලා ඇති ඉඩමෙහි මායිම් මෙහි පහත සඳහන් වේ. :

| | | |
|---|---|---|
| *උතුරට* | : | සොදුරුගම පාර, |
| *නැගෙනහිරට* | : | ප්‍රවේශ මාර්ගය, |
| *දකුණට* | : | රජය සතු ඉඩම, |
| *බටහිරට* | : | ෂොත්මන්ගේ ඉඩම |

3. ඉල්ලා ඇති ඉඩම අවශ්‍ය කාරණය සඳහා බදු දීමට පුළුවන. එබැවින් රජයේ සම්මත සෙසු කොන්දේසිවලට යටත් කොට ඉඩම බදු දීමට රජය අදහස් කොට තිබේ. :

*(අ.)* *බදු කාලය* : අවුරුදු තිහයි (30) (2024.08.07 දින සිට 2054.08.07 දක්වා).

*වාර්ෂික බදු මුදල* : 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහකට (රු. 5,000,000) වඩා අඩුවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2024 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 2% කි. 2024 වර්ෂයේ ඉඩමේ තක්සේරු වටිනාකම රුපියල් මිලියන පහ හෝ මිලියන පහට (රු. 5,000,000) වැඩිවන අවස්ථාවලදී ප්‍රධාන තක්සේරුකරුගේ තක්සේරුව මත 2024 වර්ෂයේ ඉඩමේ වෙළඳපොළ වටිනාකමින් 4% කි. මෙම බදු මුදල සෑම අවුරුදු 05 කට වරක් ම සංශෝධනය විය යුතු අතර එය කලින් අවුරුදු 05 අවසානයේ අය කළ වාර්ෂික බදු මුදලට 20% ක් එකතු විය යුතුය.

වාර මුදල : අය නොකෙරේ,

*(ආ.)* මෙම ඉඩම ජල කුළුණක් සහ නඩත්තු කාර්යාලය ඉදි කිරීම සඳහා මිස වෙනත් කටයුත්තක් සඳහා නොයෙදවිය යුතුය,

*(ඇ.)* මෙම බද්ද ඇරඹී අවුරුද්දක් ඇතුළතදී පළාත් ඉඩම් කොමසාරිස්/ ප්‍රාදේශීය ලේකම්ගේ සිත් ගන්නා පරිදි සංවර්ධනය කළ යුතුය,

*(ඈ.)* පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ),/ප්‍රාදේශීය ලේකම්, ව්‍යාපෘතියට අදාළ ආයතන හා අනෙකුත් ආයතන විසින් පනවා ඇති අනෙක් විශේෂ කොන්දේසිවලට ද මෙම බද්ද යටත් විය යුතුය,

*(ඉ)* සාදා ඇති සහ සාදන ලද ගොඩනැගිලි මනා සංවර්ධන තත්ත්වයකින් පවත්වාගෙන යා යුතු ය,

*(ඊ.)* ඉඩම බදු දී ඇති කල්හි බදුකරු විසින් ඉඩම ලබා ගත් කරුණ සාක්ෂාත් කර ගැනීමට නියමිත කාල සීමාව තුළ අසමත් වූ විටක බද්ද අවසන් කිරීම සඳහා ක්‍රියා කරනු ලැබේ,

*(උ.)* 2024.08.07 දින සිට වසර 05 ක් ගත වන තුරු මෙම ඉඩම බදුගත් කරුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වන අතුරු බදු දීම් හෝ පැවරීම් හැර වෙනත් අතුරු බදු දීම් හෝ පැවරීම් සඳහා අවසර දෙනු නොලැබේ.

*(ඌ.)* බදු කුළිය නොකඩවා ගෙවිය යුතු අතර, බදු පැහැර හැරීම් කළ අවස්ථාවන්හි දී ගිවිසුම ඉබේටම අහෝසි වනු ඇත.

*ගැසට්* පත්‍රයේ පළ කළ දින සිට සති 06 ක් ඇතුළතදී අදාළ ඉඩම බදු නොදිය යුතු බවට පිළිගැනෙන හේතූන් ලියා මා වෙත ඉදිරිපත් නොකළහොත් ඉල්ලීම අනුව බදු දෙනු ලැබේ.

ආර්. ඩී. එල්. චමිඳු ලක්ෂාන් ජයරත්න,
සහකාර ඉඩම් කොමසාරිස්,
ඉඩම් කොමසාරිස් ජනරාල් *වෙනුවට.*

2024 ඔක්තෝබර් මස 15 වැනි දින,
බත්තරමුල්ල, රජමල්වත්ත පාර, "මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලයේ, අංක 1200/6 හි,
ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

11 - 201

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.